**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

**රෙදිපිළි හා ඇඟළුම් කලා අධ්‍යයනාංශය**

**දෘශ්‍ය කලා පීඨය**

# පුරප්පාඩු

## තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුර

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ රෙදිපිළි හා ඇඟළුම් කලා අධ්‍යයනාංශයේ තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුර සඳහා සුදුස්සන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් 2026.08.14 දින දක්වා භාර ගනු ලැබේ.

මෙය තාවකාලික තනතුරකි. මෙම පත්වීම වසරක කාලයක් සඳහා වලංගු වන අතර, කාර්ය සාධනය සහ සේවා අවශ්‍යතාවය සලකා බැලීමෙන් උපරිම වශයෙන් තවත් මාස 12ක කාලයක් සඳහා දීර්ඝ කිරීමට හැකියාව ඇත.

**<u>තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුරට අදාළ මූලික සුදුසුකම්</u>**

1. **<u>අධ්‍යාපන සුදුසුකම්</u>**

ඇඳුම් විලාසිතා නිර්මාණය, පරිගණක මෘදුකාංග භාවිතයෙන් විලාසිතා නිර්මාණය, සම් ආශ්‍රිත විලාසිතා නිර්මාණය හා නිෂ්පාදනය පිළිබඳ අත්දැකීම (යන්ත්‍රසූත්‍ර භාවිතය), ජීව චිත්‍ර ඇඳීමේ හා මෘදුකාංග භාවිතයෙන් නිදර්ශන චිත්‍ර ඇඳීම යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් හෝ කිහිපයක් ආවරණය වන,

1.1 ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

1.2 දෙවන පෙළ (පහළ) සාමර්ථ්‍යයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

- ඇඳුම් විලාසිතා නිර්මාණය, පරිගණක මෘදුකාංග භාවිතයෙන් විලාසිතා නිර්මාණය, සම් ආශ්‍රිත විලාසිතා නිර්මාණය හා නිෂ්පාදනය පිළිබඳ අත්දැකීම (යන්ත්‍රසූත්‍ර භාවිතය), ජීව චිත්‍ර ඇඳීමේ හා මෘදුකාංග භාවිතයෙන් නිදර්ශන චිත්‍ර ඇඳීම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම හා සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

## 2. <u>පත්වීමට අදාළ වැටුප් සහ අනෙකුත් කොන්දේසි</u>

**<u>තාවකාලික සහකාර කථිකාචාර්ය</u>**

වැටුප් කේතය - U – AC 2

මාසික වැටුප - 85,305.00 සහ අනෙකුත් අනුමත දීමනා (2026.01.01දිනට)

**මූලික කොන්දේසි**

1. මෙම තනතුර සඳහා උනන්දුවක් සහ අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, විශ්වවිද්‍යාල වෙබ් අඩවියට **(www.vpa.lk)** පිවිස තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා වන අයදුම්පත සම්පූර්ණ කර, සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය හා සේවා පලපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද සමඟ 2026.08.14 දින ප.ව.4.00ට පෙර ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දෘශ්‍ය කලා පීඨය නොː 46, හෝර්ටන් පෙදෙස, කොළඹ 07."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සහ අධ්‍යයනාංශය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**නියමිත දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

ලේඛකාධිකාරී

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

2026.06.18